**මතුගම ප්‍රාදේශීය සභාව - 2023**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මතුගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ජේද අංක 3.27 සිට 3.32 ජේදයන්ට අනුකූල නොවන ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

1.6.2 **ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ කොම්පොස්ට් අංගනයේ බිම සකස් කිරීමට දරන ලද රු.953,761 ක වියදම රු.891,334 ක් ලෙස ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණු අතර කොම්පොස්ට් අංගනයේ අනෙකුත් ඉදි කිරීම් වෙනුවෙන් වර්ෂය තුල දරන ලද රු.1,959,018 ක් ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) බෙලිඅත්තකන්ද පානීය ජල ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම සඳහා ලද රු.1,994,605 ක ප්‍රතිපාදන වර්ෂය තුල වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ලෙස රු.2,000,000 ක් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් ප්‍රතිපූර්ණය වෙනුවෙන් රු.100,111,630 ක් ලැබී තිබුණද එය රු.99,387,768 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අංක 0000837518 දරන ලංකා බැංකු ගිණුමේ ශේෂය රු.2,461,134 ක් වුවද, එය රු.2,695,092 ක් ලෙස එනම් රු.233,958 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) පෙර වර්ෂය සඳහා කඩ කුලී රු.422,172 ක් අඩුවෙන් බිල් කිරීමේ වරද නිවැරදි කිරීමේදී වටිනාකම සමුච්චිත අරමුදලට බැර කළයුතු වුවත්, ප්‍රවර්තන ආදායමට බැර කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු රු.402,915 ක ආයුර්වේද භාණ්ඩවල වටිනාකම වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (උ) 2019 වර්ෂයේදී මිලට ගන්නා ලද මෙතෙක් ගිණුම්ගත නොකළ රු.2,808,341 ක් වටිනා පිරියත උපකරණ අයිතම 17 ක් ප්‍රත්‍යාගණනය කිරීමකින් තොරව පිරිවැය වටිනාකමට ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) 2023 වර්ෂය සඳහා ලද රු.16,508,803 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන රු.139,403,397 ක් ලෙස එනම් රු.122,894,594 ක් වැඩියෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.7,564,944 වෙනසක් විය. | 2024 ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.21,750,676 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.22,666,765 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 12,701,633 | 12,116,195 | 9,314,302 | 7,395,121 | 14,949,575 | 14,746,013 | 10,469,809 | 4,276,204 |
| (ii) | කුලී | 6,975,000 | 7,607,808 | 5,916,308 | 2,353,800 | 6,813,555 | 6,732,091 | 5,201,651 | 1,530,440 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,588,000 | 3,175,990 | 3,055,690 | 264,218 | 430,000 | 374,550 | 370,800 | 3,750 |
| (iv) | වෙනත් ආදායම් | - | - | - | - | 2,374,000 | - | 3,786,611 | - |
| | | 22,264,633 | 22,899,993 | 18,286,300 | 10,013,139 | 24,567,130 | 21,852,654 | 19,828,871 | 5,810,394 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i)සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.9,580,966 ක් වූ වරිපනම් බදු හිඟයෙන් වර්ෂය තුලදී රු.4,593,227 ක් හෙවත් සියයට 48 ක් අයකර ගෙන නොතිබුණි. | 2024 .04.30 වන විට රු.1,062,015 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii)සමාලෝචිත වර්ෂය ආරම්භයට ව්‍යාපාර බදු හිඟය රු.474,878 ක් වු අතර වර්ෂය තුලදී ඉන් රු,143,918 හෙවත් සියයට 30 ක් අයකර ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම ඇතුළුව අය වීමට ඇති මුළු මුදල රු.264,218 ක් බව. | -එම- |
| **(ආ) කුලී** | | |
| කඩ කුලී වාර්ෂික බිල් කිරීම රු.6,479,489 කින් වර්ෂය තුලදී රු.1,691,500 ක් හෙවත් සියයට 26 ක් අයකර ගෙන නොතිබුණි. | මේ වන විට හිඟයෙන් රු.187,625 ක් අයකර ගෙන ඇති බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 පෙබරවාරි සිට සභාව සතු පරිශ්‍රයක බාහිර පාර්ශවයක් විසින් ගිවිසුම්ගත වීමකින් තොරව ඉදි කර පවත්වාගෙන යන කඩ කාමර 19 ක් සම්බන්ධයෙන් සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | කඩ කාමර කුලිය තක්සේරු කර වාර්තාවක් ලැබී ඇති බව හා ඒ අනුව කඩහිමියන් 14 දෙනෙකු සමඟ ගිවිසුම්ගත වී ඇති බව හා ඉතිරි 05 දෙනාටද ගිවිසුම් අත්සන් කිරීමට දැනුවත් කර ඇති බව. | සභාවට ලැබිය යුතු ආදායම අහිමිවීමට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විමර්ශන සිදු කර අලාභ අයකර ගත යුතුය. |

3.2 **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ මතුගම, ප්‍රාදේශීය සභාවේ කාර්යයන් පරිගණක ජාලගත කිරීම සඳහා පද්ධති 07 ක් වෙනුවෙන් පුද්ගලික සමාගමකට රු.1,565,000 ක් ගෙවා තිබුණි. අදාල ගිවිසුමේ 06 111 කොන්දේසිය ප්‍රකාරව වැඩ කරන දින 180 ක් ඇතුළත මෘදුකාංග පද්ධති සියල්ල ස්ථාපිත කළ යුතු වුවත්, වරිපනම් හා කඩ කුලී යන පද්ධති 02 හැර සෙසු පද්ධති 05 සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිගණක ජාලගත කර නොතිබුණි. | ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට දත්ත ඇතුලත් කරමින් පවතින බව හා වැටුප් සැකසීම, පුස්තකාල කටයුතු හා ගබඩා හා ලිපි ලේඛන තොග පාලනයට වෙනත් පද්ධති ක්‍රියාත්මක වන බව. | මිලදී ගත් මෘදුකාංග පද්ධති කාර්යක්ෂමව හා ඵලදායිව භාවිතා කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |
| (ආ) 2015 වර්ෂයේදී මිලදී ගත් මෘදුකාංග පද්ධතිය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබියදීත් තවත් පද්ධති 03 ක් මිලට ගැනීම වෙනුවෙන් 2018 වර්ෂයේ රු.1,855,000 ක් උක්ත ආයතනයට ගෙවා තිබුණි. මේ සඳහා මතුගම, ප්‍රාදේශීය සභාව සහ සමාගම අතර අත්සන් කරන ලද දින රහිත ගිවිසුම් පත්‍රයේ 03 කොන්දේසියට පටහැනිව සම්පූර්ණ පද්ධතිය ජාලගත කිරීමකින් තොරව හා විධිමත් පුහුණුවක් ලබා දීමෙන් තොරව සම්පූර්ණ ගාස්තුව ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ආර්ථික නොවන මිලදී ගැනීම් සිදු නොකළ යුතුය. |
| (ඇ) මෘදුකාංග පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක නොවී තිබියදීත් 2020 වසරේ සිට 2023 වර්ෂය දක්වා | මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක කිරීමට මහජන බැංකුව සමඟ | මිලදී ගත් පද්ධතීන් ආර්ථික වාසි සැලසෙන |

| | | |
|---|---|---|
| එම ආයතනයට වාර්ෂික ගාස්තු ලෙස එකතුව රු.608,528 ක් ගෙවා තිබුණි. | සම්බන්ධවී මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් පහසුකම් ලබා ගත යුතු බව. | අයුරින් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) මෙලෙස සභාවට අලාභ සිදු වන අයුරින් මෘදුකාංග මිලට ගෙන නිශ්කාර්යව තැබීම හා ගිවිසුමට පටහැනිව ගෙවීම් කිරීම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි 156 පරිදි කටයුතු කර නොතිබුණි. | අධික පිරිවැයක් දැරීමට සිදුවන නිසා මෙම සේවාව ලංකා බැංකුවෙන් ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති බව. | ගිවිසුම්වලට පටහැනිව ක්‍රියා කිරීම හා වත්කම් නිසි පරිදි භාවිතයට නොගැනීමට අදාලව මුදල් රෙගුලාසි ප්‍රකාරව පියවර ගත යුතුය. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 පෙබරවාරි මස රු.601,480 ක් වැය කර වරිපනම් දේපළ තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදීද නව තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි. | කොවිඩ් තත්ත්වය නිසා වරිපනම් අය නොකරන ලෙස දන්වා තිබූ අතර නැවත 2024 වර්ෂයේ සිට අය කිරීම ක්‍රියාත්මක කර ඇති බව. | ලැබිය යුතු ආදායම අහිමි වීමට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

3.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2022 ඔක්තෝබර් මස සභාව සතු ජේ.සී.බී යන්ත්‍රය අළුත්වැඩියාවේදී මිල ගණන් කැඳවීමකින් තොරව රු.470,250 ක් වැය කර සභිකයෙකුගේ සහෝදරයෙකුගේ ගරාජයකින් අළුත්වැඩියා කර තිබූ අතර ඒ සඳහා වගකීම් සහතිකයක් ලබාගෙන නොතිබුණි. | විමර්ශන කටයුතුවලට අදාල ලිපිගොනුව ලද පසු පිළිතුරු ලබාදෙන බව. | සභාවේ ගණුදෙනු විධිමත්ව හා විනිවිදභාවයෙන් සිදු කළ යුතුය. |
| (ආ) ඉහත අළුත්වැඩියාව නිසි පරිදි ඉටු කර ඇති බව ඩිපෝ ඉංජිනේරු නිර්දේශ කර තිබුණද, එය නැවත ක්‍රියා විරහිතවීම නිසා එම අළුත්වැඩියාවම නැවත කිරීමට 2023 මාර්තු 02 දින ඩිපෝ ඉංජිනේරු නිර්දේශ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් බැකෝ යන්ත්‍රය නිශ්කාර්යව පැවතුණි. | විමර්ශන කටයුතුවලට අදාල ලිපිගොනුව ලද පසු පිළිතුරු ලබාදෙන බව | පිළිගත හැකි නිර්දේශ මත ගෙවීම් සිදු කළ යුතුය. |

3.5 **නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2010 වර්ෂයේදී රු.5,100,000 ක් වැය කර ඉදි කරන ලද ගල්මත්ත පොදු වෙළඳසැල දෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමර සමාලෝචිත වර්ෂය තුල කුලියට දීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | මෙම කඩ කාමර 2024 වර්ෂයේදී ද ටෙන්ඩර් කළ අතර ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවීම මත මෙලෙස පවතින බව. | සභාව සතු වත්කම් මගින් ආදායම් උත්පාදනයට කටයුතු කළ යුතුය. |
| (ආ) බෙලිවත්තකන්ද පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.785,795 ක් වැය කර 2022 නොවැම්බර් මස මිලදී ගන්නා ලද වතුර මෝටරය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණු අතර රු.1,994,605 ක් වැයකර තිබුණු එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත ප්‍රතිලාභයක් ලබාදී නොතිබුණි. | ව්‍යාපෘතිය 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇති බව. | වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |

3.6 **වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු ඉඩම් ලෙස හඳුනාගෙන තිබු ඉඩම් 252 න් ඉඩම් 48 කට අදාලව නීත්‍යානුකුල අයිතිය තහවුරු කිරීමට අදාල ලේඛන සභාව සතුව නොතිබුණි. | ඉඩම පවරා ගැනීමට නියෝග පත්‍ර සකසා පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව. | සභාව සතු ඉඩම් සඳහා නීත්‍යානුකූල ලේඛන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2015 වර්ෂයේ සභාව වෙත ලැබී ස්ටියර් ලෝඩර් යන්ත්‍රය සහ ජල ප්‍රවාහන ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ඉදිරියේදී ඉටු කරන බව. | සභාව සතු වාහන සභාව නමින් ලියාපදිංචි කර ගත යුතුය. |

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන විෂයය ක්ෂේත්‍ර ඇතුලත් කර අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර තිබුණද, එම සැලැස්ම මගින් අපේක්ෂිත විගණන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි. | වරද පිළි ගන්නා අතර 2024 වර්ෂයේ සිට ප්‍රමාණවත් විගණනයක් සිදු කිරීමට කටයුතු කරන බව. | අදාල ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර වාර්තා නිකුත් කළ යුතුය. |